පහන් වැට තුළට විත් දල්වන්න පහනක් සුදිලෙන්න කවියක්ව නුඹේ සිතුවිලි සයුරෙන්

-වියත් පන්හිඳ-

ඔප් නැගුණු විසල් මේසයක් මත
තබා සුදු සුමුදු කරදාසියක්
ඒ මත පාකර් පෑන් තුඩකින්
ලියන්නට මට නොමැත කවියක්

වැඩ ඇරී ගෙදර එන කලට ඔබ සමඟ
සෙනඟින් පිරී ගිය දුම්රියක
අවුලා ගෙන හිස් සිගරට් පැකට්ටුවක්
ඒ මත පැන්සල් කෙටියකින්
කුරුටු ගාන්නට මට ඇත කවියක්

එසේ වුව සොයුරෙනි!
ඔබ ගැන ම මා ලියන ඒ කවිය
ඔබගෙන් බොහෝ දෙනෙකුට
අද දින නොවැටහෙන බව දනිමි

ලෝකය මීට වඩා යහපත් වන
අනාගතයේ යම් දවසක
ඔබ එය මීට වඩා ආදරයෙන්
කියවන බව ද දනිමි

-සේකර-

ඉදිරියට ☞ ☞

මියැදීම

විසල් ලෝකයෙහි ශක්තිමත්ව
පියමැන්න දුර වැඩිය
යා යුතු මග කෙටිය
නමුත් දුර්වලය
ගෙවී ගිය
සතුටේ හෝ වේදනාවේ
ප්‍රමාණය
මිණුම් දණ්ඩකින්
මැනිය හැකිද

කඳුළු වගුරවමින්
හඬන්නට හැකි නමුත්
සුසුම් හෙළමින් එය විඳියි
අතපය වාරු නැති
හදේ දැවෙන
දුක් දොම්නස් උහුලමින්
පැදුරු කඩමාල්ලක
සුව පහසු යහනක
වීදි කොණක
මග තොට දී
අවසන් හුස්ම
වා තලයට මුසු කරාවී.

නිල්මිණි ප්‍රියදර්ශිකා
ජර්මනිය

අච්චාර යුග ලිපිය

නො: $000
ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී මාවත,
කුසගින්න
දුප්පතුන්ගේ ලෝකය
දිනය: සදාතනිකයි

(දෙවියන් අප දෙස නොබලන නිසා දෙවි පිහිට නොපතමි)

මා ආදරණීය වූ
යුක්ති පුතේ,

නුඹ නැති සොවින්
සාධාරණ අම්මා
හැඬූ කඳුළෙන් දිවි ගෙවයි
මිනිස්කම අයියා
පිස්සෙක්ව ලත වේ..
නීතිය නංගී
පස්සා දොරකඩට වී
ඉකි බිඳියි
අයිතිවාසිකම් මල්ලී
ගොළුවකු වී බලා හිඳියි

පෙබරවාරි 30 වනදා නුඹ නිදහස් වන බව අසා සතුටු වුණෙමි. මම නුඹ එන මග බලා හිඳිමි.

මේ නුඹෙ ආදරණීය
අධිෂ්ඨානයේ පියා,

අරෝෂ් වික්‍රමරත්න,
ජර්ත්
බට/ඩස්ට්‍රේලියාව

ප්‍රේමය නම්..!

ඇතිවිට ? කි.
නැතිවිට ! කි.

වර්ණ රසිකා ඒකනායක

පසුගිය ජුනි කලාපයේ මංගල රාත්‍රිය නම් වූ කවිය සුභාෂිණී හේරත් ගේ වන අතර එහිදී සුභානි යනුවෙන් ඇගේ නම පළවීම මෙසේ නිවැරදි කරමු.

සන්නස පහන් වැටෙහි අරමුණ කවියට, කලාවට ලැදි පරපුරක් බිහි කිරීම සඳහා හැකි උපරිම දායකත්වය ලබා දීමයි. උපරිමයෙන් කවි පිටුව පුරවන්නේ ද මෙනිසාය. තනතමින් පද එකතු කර, කවියක් සේ තම සිතැඟි ඉදිරිපත් කරන කවරෙකුට වුවද සන්නසෙහි ඉඩ සැදෙනුයේ ඔහු මතු දිනයෙක දක්ෂ, යහපත් කවියෙකු වනු දැකීම උදෙසාය. පහන් වැට ඔබගේම වන්නේ ද එනිසාය.

ඔබේ නිර්මාණ මෙම ලිපිනයට එවන්න.
Sannasa Pahan Weta
61 Nattle Drive
Hallam Vic 3803
Australia
Email:
sannasanews@gmail.com

හිම ගිර

හිරුට හොරෙන් බොල් පිණි පොද කැටිව හිමට හැරී
සඳුට සිනාසෙමින් ගලන ලා දියරෙන් වැරී
ගතට නුහුරු සිසිලස ගැන උදහස් නොම දැරී
සිතට සුවය ළං කළ හිමකබා ගතට සරී

එදා හරිත ගහ කොල වැල් වැසී සුදට සුදේ
ගිරගින් විත් බෙයද වසා කිරි කැටි හිම මිදේ
විහඟුන් විත් ගයමින් ගී රැඟුම් රඟන සඳේ
සිරියෙන් දිසි තැන්නකි සුදු පළසක් එළු ලෙදේ

කන්ද පුරා ඉහිරී සුද සිසිල ගෙනෙන වා
ලන්ද පසා කර සුදු කැටි නියරෙ නටන වා
නින්ද නොයා රෑ මැදියම සීතෙ ගැහෙන වා
කුන්ද සමන් මල් වෙනුවට හිම දිලිසෙන වා

සැඩ හිරු රැස් පතුරන ගිම්හානයෙ හද නොලා
කොසියොස්කෝ කඳු යායම හිමවත සරි වෙලා
කෙළි ලොල් වී හිම මත්තේ දන රඟ දෙනු බලා
දිය දෝතක් ලැබී මරේ ගලයි උදම් වෙලා

නීල වලා පෙළ අස්සෙන් දිව් හය පෙළ මෙනා
දෙකඩව රට මැදි කර් යන නිල් කඳු පෙළ මනා
ගන්ඩගායි වලින් පසුව හිමවත හමු වුනා
මහ බෙදුමේ කඳු යායෙන් එගොඩ මෙගොඩ වුනා

කොසියොස්කෝ හිමෙන් වැසෙන විට මහ සිසිල සේ
උරණ වෙලා දිනකර යයි නොබලා ඒ දෙ සේ
සිව් දෙස මහ කතර අතර හාදු දෙමින් තො සේ
පොළොව සිඹින දිනිතිට එක් වෙති හැම අනල සේ

හිම සුදු සළු ගත දවටා නව අසිරිය පෙන් නා
අධි සිසිලසෙ ඔබ හමුවට නෙක දන කැඳවන් නා
කොසියොස්කෝ ඔබ රූබර ළඳ නිසළව ඉන් නා
හිරු සඳු කිරණින් පෙන්වන අරුමය ඔබ දන් නා

හෙන්රි කුමාරප්පෙරුම

විසිතුන් වසක් ගෙවුණා

අම්මා නැතුව නවසිය අසූපස් වස විසිතුන ජූනී
මා හද පහන් කළ මිණි පහනක් නිවුනී
විසිතුන් වසක් ගෙවූ දින ඔබ නැති දුකිනී
මේ කව් කළඹ ඔබහට පුදනෙමි බැතිනී

ඔබ වෙන්වූ මොහොත අද මෙන් දැනෙයි මට
තව සියවසක් ගෙවුණත් එකසේය මට
කප්රුක පහළ වී දෙව් සැප ලදත් මට
අම්මේ ඔබ නැතිව කිසිවක් එපා මට

ඔබ ගැහැණියක් වී සැම පැණ විසඳුවා
මගෙ පැණ විසඳන්න ඔබ දිරියක් වූවා
ගැහැණුන් නිසා පැණ ඇති වන මත දැරුවා
එය බොරුවකැයි කී විට මට සැර කෙරුවා

පිරිමින් නිරතයෙන් ගැහැණුන් මුලා කර
තම කාරියන් සැමවිට කර ගනිති තර
මින් ගැලවෙන ලෙසට ඔවදන් දී නිතර
ඔබ වෙහෙසුණා අම්මේ ඔබ දයාබර

පෙම් සටනකින් මා පැරදේ යයි සිතලා
හැඬුවෙමි අකීකරු වී ඔබෙ සිත බිඳලා
මතකයි ඔබත් හැඬුවා හොඳටම බැනලා
තේරුම් ගතිමි සෙනෙහස, නොගියෙමි පැනලා

පසවෙයි වෙහෙස දරු ලද අඟනුන්ම මිස
පිරිමින් කිසි දිනෙක නොදනිති නියම ලෙස
කියමින් පෙමින් පිරිමදිමින් මගේ හිස
ඇඳ ළඟ රැයක් සිටියා නොපියවා ඇස

ලැබුණා පුතෙක් පසුදා එළිවන ජාමේ
සතුටින් ඉපිල මේ ලෙස කීවා අම්මේ
ලොවටම පුතුන් බිහි කරවන මහ පුදුමේ
ගැහැණුන් මිසක් පිරිමින් කවදද කෙරුවේ

ලොකුවට නොදැරුවත් මත ස්තිරි වාද
තොටිලය පද්දවන අත රට රකින සඳ
නිතරම ඔබෙ මුවින් පිටවුණ වදන් සොඳ
සිහිපත් කරමි ඔබ මිය ගිය දිනයෙ අද

තිස්තුන් වියේදී වැන්දඹුවක් වූවා
ඒ ගැන සිතා ඔබ නිතරම දුක් වූවා
දූවරු තිදෙන රැකුමට දිරිමත් වූවා
අම්මේ මමත් ළඟදී වැන්දඹු වූවා

අම්මා නිසා මා මේ ලෙස උපත දරා
අම්මා දුන්න ඔවදන් සැම අගේ කරා
අම්මා කියන්නට ඔබටම පෙරුම් පුරා
අම්මා වෙන්න මට, සසරේ වසන තුරා ...

මල්ලිකා - බර්ලීන්

ඔබේ නිර්මාණ සෑම මසකම 15 දා ට පෙර එවන්න.

සංස්කරණය
තුෂාරී ප්‍රියංගිකා

පුරා හඳට දෙන්න මිටක් බලන්න එය වටාපතක්

සෝකාන් -13 වන සියවස-
පරිවර්තනය: ආරියවංශ රණවීර

අසමිමත ලබැදීම

සෙනෙහසට ලොබ වීමි
පරතරය නොතකාම
හදවතට ලංවීමි
දිනෙන් දින නොදැනීම

එවන් පෙම රැක ගනිමි
වස්තුවක් වීලසේම
මතකයේ රඳා ගමි
නිහඬ ඉකියක් සේම

පිහිතලා එන්නට තරම්
සයුර තරනය කරන්
පතන්නෙමි ලබනට වරල්
නැති නිසා දසුනට වරම්

නොපෙනෙනා නෙත් දුරින් සිට
හද කොනක නතර උන
ලොවට රහසින් ගලන
කඳුළු බිඳුවක් පමණි අද ඔබ

යසා හෙනබර්ග්
ජර්මනිය

ගැරහුම්

පුපුරයි අසෙනි
නුබ ගැබ දෙපළු
කරන්නට
බලා උන්නෙමි
නිහඬව
වැටෙන වැහි බිඳු වලට
පතිත වන්න ඉඩ හැර

ප්‍රශංසනී පරණවිතාන

සාමයේදී ඔබේ දහදිය වැඩියෙන් හෙලූ තරමට යුද්ධයේදී රුධිරය හෙළන්නේ අඹුවෙනි.
-හයිමන් රිකෝවර්-

රෑ අහස

රෑ අහසේ පායා එන සඳ කුමරුට
සිසිළ ගෙනෙන පෙම් උල්පත ඔබය
සඳ කුමරුට තනියට එන
හෙමි හෙමිහිට පායන
රන් පැහැසර වූ තරු මල ද ඔබය..

සුවඳ දිදී එන සුළඟට පිපී වැනෙන
අවිහිංසක සිත් මල ද ඔබය
හිත් මල අග කටු ඇති බව
දැන දැන මල් සුවඳ විඳින
පුදුම හිතෙන බඹරිඳු ද ඔබය...

අරුණැල්ලේ නැවුම් සුවය අරන් වඩින
හොර රහසේ සැඟවී යන
ආදරබර පිණි මුතු බිඳුව ඔබය
පිණි බිඳුවට රැඳී ඉන්න
නෙළා ගන්න කියා කියන
සෙනේවන්ත හිත් මල ද ඔබය.

අනුරාධා ගමගේ

අම්මේ හනික ගෙදර එන්න

පාසැල් යන දරුවන්හට
පොත්පත් ටික අරන් දෙන්න
කුස ගින්නට බඩ පිරෙන්නට
කන්න යමක් රත් කරන්න
දුකක් නැතිව වැටිලා ඉන්න
ගේ පොඩ්ඩක් හදා ගන්න
මුදල් සොයන් මං එනකල්
දරුවො හොඳින් බලා ගන්න
එලෙස කියා තාත්තාට
අම්මා ගියේ මැද පෙරදිග
අපෙ දුක සැප ගැන බලන්න
නැහැ සිහියක් තාත්තාට
අම්මා නැති දුක නිවන්න
පුරුදු වෙලා ගිනි වතුරට
ලිප ගිනි මෙලවුනෙ නැතුවට
හිත ගිනි ඇවිලෙයි හැම විට
නංගි මල්ලි හඬ හඬ හිඳ
හාමතේම යයි නින්දට
ඉසුරු එපා අම්මෙ අපිට
ඔබෙ සෙනෙහස ඇති හොඳටම
තුරුළු වෙලා ඉන්න එකට
අම්මෙ හනික ගෙදර එන්න

කාන්ති ගලප්පත්ති

කියවන්න... ලියන්න... තොරතුරු දැන ගන්න.. www.ketapathpawra.com වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත් කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.